ලංකා බැංකුව

ශ්‍රී ලංකාවේ අංක 1 බැංකුව හා එක්ව ශක්තිමත් වෘත්තීය ගමනක් ආරම්භ කරන්න!

බැංකු ක්ෂේත්‍රයේ ඉදිරියට යාමට අපේක්ෂා කරන සුදුසුකම්ලත් තරුණ, උද්යෝගිමත් මෙන්ම අරමුණු වෙත හඹායන පුද්ගලයන්ගෙන් පහත දැක්වෙන තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අභ්‍යාසලාභී ලේකම් සහකාර

යෝග්‍යතා නිර්ණායක

➢ **ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.**

➢ **සුදුසුකම්**

- අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව ඇතුළු විෂයයන් 3 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 6 ක් (අමතර විෂයන් හැර) සමත් වී තිබීම.

සහ

- අ.පො.ස (උ. පෙළ) විභාගයේදී ප්‍රධාන විෂයයන් 2 ක් (සාමාන්‍ය ඉංග්‍රීසි හා සාමාන්‍ය දැනීම හැර) එකවර සමත් වී තිබීම.

සහ

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ලියාපදිංචි ඕනෑම පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද ලේකම් පරිචය පිළිබඳ අවම වශයෙන් මාස හයක (6) ඩිප්ලෝමා/ සහතික පත්‍ර පාඨමාලාවක් (ඉංග්‍රීසි මාධ්‍යය) සම්පූර්ණ කර තිබීම.

➢ **පළපුරුද්ද**

පිළිගත් ආයතනයක හෝ බැංකු/ මූල්‍ය අංශයේ පෞද්ගලික සහකාර/ ලේකම් සහකාර/ ලේකම්වරයෙකු වශයෙන් පළපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

➢ **අවශ්‍ය අනෙකුත් ගුණාංග හා නිපුණතා**

- පරිගණක යතුරු ලිවීමේදී ඉංග්‍රීසියෙන් විනාඩියකට වචන 20 ක වේගයක් තිබිය යුතු අතර සිංහල දෙමළ/ යතුරු ලිවීමේ සහතිකයක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ
- ඉංග්‍රීසි සහ සිංහල/ දෙමළ භාෂා ලිඛිත සහ කථනය පිළිබඳ මනා දැනුමක් තිබීම
- විශිෂ්ඨ සන්නිවේදන හැකියාව හා ආකර්ෂණීය පෞරුෂය.
- MS Office යෙදුම් පිළිබඳව මනා දැනුමක් තිබීම.

➢ **වයස**

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය වනවිට වයස අවුරුදු 28 ක් හෝ ඊට අඩු විය යුතුය.

නියමයන් හා කොන්දේසි

- පුහුණු කාලසීමාව වසර දෙකක් (02) වන අතර, මෙම පුහුණු කාලසීමාව තුළ මාසික දීමනාවක් (1 වන වසරේදී මසකට රු. 45,000/= සහ 2 වන වසරේදී මසකට රු. 60,000/=) ගෙවනු ලැබේ.
- මෙම තනතුර බැංකු සේවයේ සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත්වන තමුත් සාමාන්‍ය බැංකු ක්ෂේත්‍රයෙන් පරිබාහිර (සංවෘත සේවය) වේ.
- පුහුණු කාලසීමාව තුළ බැංකුව සෑහීමකට පත්වන පරිදි අවශ්‍යතා සපුරාලීම මත ඔබ සුදුසුකම්ලත් අයකු ලෙස තහවුරු වුවහොත්, වසර දෙකක (02) පුහුණු කාලයකින් පසු ඔබව බැංකුවේ ස්ථිර සේවයේ ලේකම් සහකාර -1 ශ්‍රේණියෙහි ස්ථිරකරනු ලැබේ.
- සාමාන්‍ය කාර්යාල වේලාවෙන් පසුව සහ සති අන්ත/ නිවාඩු දිනයන් හි සේවය කිරීම අපේක්ෂා කෙරේ.
- බැංකුවේ අවශ්‍යතාව පරිදි දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

තෝරා ගැනීමේ පටිපාටිය

මෙය, තෝරාගැනීමේ විභාගයක් හා ඉන් අනතුරුව පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකින් සමන්විත වේ.

a. I වන ප්‍රශ්න පත්‍රය - පරිගණක ඉංග්‍රීසි යතුරු ලියන වේග පරීක්ෂණය (විනාඩියට වචන 20)

b. II වන ප්‍රශ්න පත්‍රය - ඉංග්‍රීසි භාෂාව
යන ප්‍රශ්න පත්‍රවලට මුහුණ දිය යුතුවේ.

(I වන ප්‍රශ්න පත්‍රයෙන් (වේග පරීක්ෂණය) සමත්වන....) අපේක්ෂකයින් පමණක් (II වන ප්‍රශ්න පත්‍රයට (ඉංග්‍රීසි භාෂාව) පෙනී සිටීමට....) කැඳවනු ලැබේ.

මෙම තරග විභාගයෙන් ලබාගත්තා ලකුණු සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුස්සන් කැඳවීම සඳහා පමණක් භාවිතා කරනු ලැබේ. අවසාන තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත්තා ලකුණු මත පදනම්ව සුදුසුකම් මත පමණක් සිදුකෙරේ.

අයදුම් කිරීමේ පටිපාටිය

- ඔබේ අයදුම්පත අපගේ වෙබ් අඩවිය වන www.boc.lk ("careers" තීරය යටතේ) හරහා 27.06.2026 වන දින හෝ එදිනට පෙර ඉදිරිපත් කරන්න. ඉදිරි කටයුතු සඳහා අයදුම්පතේ යොමු අංකය ඔබේ ළඟ තබාගන්න.
- Careers Page හි ඇති අපේක්ෂකයින් සඳහා වන උපදෙස් හොඳින් කියවා, දී ඇති උපදෙස් අනුව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කරන්න.
- ඉහත ක්‍රමයෙන් හැර වෙනත් ක්‍රමයන්ගෙන් ලැබෙන අයදුම්පත් කුමන හේතුවක් මත හෝ භාරගනු නොලැබේ.
- ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන හෝ ඕනෑම ඉල්ලුම්පතක් බදවා ගැනීමේ ඕනෑම අදියරකදී කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. යම් අයදුම්කරුවකු විසින් සහතිකපත් පරීක්ෂාකරන අවස්ථාවේදී ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සත්‍යාථ කිරීම සඳහා ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ/ ඇයගේ අයදුම්පත වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්කරු විසින් අපගේ වෙබ් අඩවිය ඔස්සේ පිවිසිය හැකි මාතෘ සම්පත් කළමනාකරණ පිටුවේ (https://www.boc.lk/hr-management) ඇති "බදවා ගැනීම් සඳහා වන පෞද්ගලික දත්ත ආරක්ෂණ දැන්වීම" අයදුම්කරන අවස්ථාවේදී කියවා එය පිළිගත යුතුය.

මානව සම්පත් අංශය,
ලංකා බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
කොළඹ 01.

- බැංකුව වෙත කුමන අයුරකින් හෝ බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසු බවට පත්කිරීමට හේතු වේ.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.
- සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව තීරණය කිරීමේ හෝ බඳවා ගැනීම කල් දැමීමේ/ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.
- බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකතාවය හා රහස්‍යතාවය ආරක්ෂා කරනු ලැබේ.

lankajobs.lk
lankajobs.lk